**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල**

1. **ශ්‍රේණිය** :-11 ශ්‍රේණිය **විෂය** :- : පෙරදිග සංගීතය **අදාළ සතිය** :- ඔක්තෝම්බර් 3 වන සතිය

**2.පාඩම/ ඒකකය**:-.6.2 සොකරි නාටකය

**3. ශිෂ්‍යයා කළ යුතු කාර්යයන්:-**

- **කියවීමේ පත්‍රිකාව ඇසුරෙන් සොකරි නාටකය පිළිබඳ කරුණු ගොනු කරගන්න.**
- **සොකරි නාටකයේ සංස්කෘතික පසුබිම**
- **සොකරි කතා පුවත**
- **සොකරි නාටක ගීත**
- **සොකරි ගීත ගායනය කරන්න.මේ සඳහා පහත ඉගෙනුම් ආධාරක භාවිතා කරන්න.**

## සොකරි කතා පුවත

සොකරි නාටකය පිළිබඳව ලියැවුණ විවිධ පුරාවෘත්ත ඇත. එක් ජනප්‍රවාදයකට අනුව එන කතා පුවත මෙසේ ය.

ගුරුහාමි ශිල්ප ශාස්ත්‍රයෙහි කෙළ පැමිණි ආඪ්‍ය ගුරෙකි. කාසි රට රූමත් කාන්තාවක වූ සොකරිය සරණ පාවා ගන්නා මොහුට 'පරයා' නම් මෙහෙකරුවෙක් ද සිටියි. ජීවනෝපායයක් සොයමින් රටින් රට යන මොවුනට සිංහල දේශයට යාමට සිත් විය. එම නිසා මුහුදු සතක් තරණය කොට ලක්දිවට පැමිණ ශ්‍රී පාදස්ථානය වැඳ පුදාගෙන ලක්දිව දකුණු පළාතේ තඹරාවිට ගමට පැමිණ ගෙපැලක් සාදා ගෙන වාසය කරන්නට සැරසෙති. බස නොතේරෙන බැවින් ඔවුනට වතුර, කෑම ආදිය සොයා ගැනීම අසීරු විය. දිනක් වතුර සොයා යන විට වෙදරාලගේ බල්ලා ගුරුහාමි සපා කයි. ඉතා අමාරුවෙන් නිවසට පැමිණ පොළොවේ වැතිරෙන ගුරුහාමි දුටු පරයා ඔහු මැරී ඇතැයි සිතා සොකරිය අනාචාරයෙහි පොලඹවා ගැනීමට උත්සාහ දරයි. ඊට උරණ වූ සොකරිය වහා ගොස් වෙදකු සොයාගෙන එන ලෙස පරයාට අණ කරයි. පරයා සමඟ නොඑන වෙදරාල කැඳවාගෙන එනු ලබන්නේ සොකරිය විසිනි.

ගුරුහාමිට වෙදකම් කළ වෙදරාල පාන්දර යාමයේ සොකරිය කැටුව පලා යයි. ගුරුහාමි සුව වී සොකරිය නැති සොවින් කතරගම දෙවියන්ට බාරහාර වී කන්නලවු කරයි. ඒ අනුව වෙදරාලගේ නිවසේ දී ගුරුහාමිට සොකරිය හමු වේ. ඒ වන විට සොකරි දරුවකු නළවමින් සිටියි. නැළවිලි ගීයට උදාහරණ ලෙස ''පාට වරුණ පුත පරමණ්ඩල පුත'' ගීතය දක්විය හැකි ය. දරුවා ද සමඟ සොකරි රැගෙන එන ගුරුහාමි, නාට්‍ය නරඹන ප්‍රේක්ෂකයන් අතට දරුවා පත් කරයි.

මෙය කෘෂිකාර්මික සමාජයක 'සශ්‍රීකත්වයේ සංකේතයක්' ලෙස සැලකේ.

# සොකරි නාටක ගීත

1. වෙදා නටන්නේ පළමු ව සබයට එන්නේ
යොදා කියන්නේ තාලෙට ගත වෙවුලන්නේ
කුදා වැනෙන්නේ සබයේ කොක් හඬලන්නේ
විදා පාන්නේ අත් දෙක තැගි කියන්නේ

2. සොකරි එන්නී සබයෙන් අවසර ගන්නී
නැටුම් නටන්නී තාලෙට රාග කියන්නී
පද අල්ලන්නී පියයුරු ළැම සොලවන්නී
කැඩපත ගන්නී සුරතින් මුහුණ බලන්නී

## I නාද මාලාව

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| සසග | රිරි- | රි-රි | ගරිස | සසග | රිරි- | රි-- | ගරිස |
| සොකරි | sඑන් | නීsස | බයෙන් | අවස | රගන් | නීss | sss |
| සසග | රිස- | ස-ධ | ගරිග | රිසස | සස- | ස-- | --- |
| නැටුම් | නටන් | නීsතා | sලෙට | රාsග | කියන් | නීss | sss |

## II නාද මාලාව

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| සසරි | ගග- | ග-රි | ගරිස | ස-රි | ගරි- | රි-- | ගරිස |
| සොකරි | sඑන් | නීsස | බයෙන් | අවස | රගන් | නීss | sss |
| සසරි | ගග- | ග-රි | ගරිස | ස-රි | ගරි- | ස-- | --- |
| නැටුම් | නටන් | නීsතා | sලෙට | රාsග | කියන් | නීss | sss |

ඉතිරි ගී පාද ද මේ තනුවට ම ගැයේ

3. පාට වරුණ පුත - පර මණ්ඩල පුත
නුඹ නාඩන් පුත - හරි රාරෝ
නින්ද තොටිල්ලේ - නැළවෙන් මගෙ පුත
නුඹ නාඩන් පුත - හරි රාරෝ

| | | | |
|---|---|---|---|
| + සරි ග ග | රි ස සරි ග | + රි ග රි ස | ස රි ස නි |
| + පාs ට ව | රු ණ පුs ත | + පර ම ණ් | ඩ ල පු ත |
| + නිස ස ස | ස - සරි ග | + රි ග රි ස | ස - - - |
| + නුඹ නා s | ඩ න් පුs ත | + හරි රා s | රෝ s s s |

ප්‍රදේශීය වශයෙන් ගී පදවල හා තනුවල සුළු වෙනස්කම් දැකිය හැකි වේ. සොකරි ගී තනු බොහෝ විට ඒකාකාරී ය. ඒකල ව ගයන සෑම ගී පෙළක් ම අත්වැල් ගායක පිරිස නැවත ගයති. බොහෝ විට අවුරුද්දේ වෙසක්, පොසොන් මාසවලට පමණක් සීමා වී දින හතක් රඟ දක්වන සොකරි නාටකය කෙළවර වන්නේ බාරහාර ඔප්පු කර නිකිණි පුර පසළොස්වක දිනයේ පවත්වන සොකරි පෙරහැරකිනි.

**4.ඉහත ක්‍රියාකාරකම සඳහා උපකාර කර ගත හැකි ඉගෙනුම් ආධාරක**

- e - නැණ පියස:- 11 ශ්‍රේණිය
- 11 ශ්‍රේණිය රංග කලා අතිරේක කියවීම් පොත
- You tube නාලිකා:-
- https://www.youtube.com/watch?v=D7O5U3WuU74
- https://www.youtube.com/watch?v=b1c3YMwiDl8

**5.අපේක්ෂිත ඉගෙනුම් ඵල:-**

- ලංකාවේ ගැමි නාටක අතරින් සොකරි නාටකයේ සාම්ප්‍රදායික තොරතුරු විමසයි.
- සොකරි ගීත ගායනය කරයි.
- නාට්‍ය ගීත අතරින් සොකරි ගීත වෙන් කොට හඳුනා ගනියි.

**සැකසුම:-** කෑගල්ල අධ්‍යාපන කලාපය